**මැදිගිරිය ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් මැදිරිගිරිය මහජන බැංකුවේ, ජංගම ගිණුම සමඟ පවත්වාගෙන යනු ලබන ඉතුරුම් ගිණුමෙහි සමාලෝචිත වර්ෂයට අදාළ රු.606,659 ක් වූ හා පෙර වර්ෂයට අදාළ රු.365,364 ක් වූ ඉතුරුම් පොලී ආදායම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ ආදායමට ගත් බව. | පොලී ආදායම් උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතුරුම් ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂයේ ලැබී ඇති රු.52,346 ක් හා පෙර වර්ෂවලට අදාළව ලැබී තිබුණු රු.50,801 ක් වූ පොලී ආදායම් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සුසාන භූමි දෙකක මායිම් වැට ඉදිකිරීම සඳහා මිලදීගෙන ගබඩාවේ තිබුණු රු.335,466 ක් වූ උපකරණ තොගයේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ජ'නල් සටහන් මගින් කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කළ බව. | කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කි.ග්‍රෑ. 27627 ක්වූ ඉතිරි කාබනික පොහොර තොගයේ වටිනාකම රු.690,675 ක් හා නොනිමි පොහොර තොග වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉතිරි තොග වටිනාකම රු.690,675 ක් ජ'නල් අංක 03 මගින් ගිණුම්ගත කරන ලද බව හා නොනිමි තොග වටිනාකම හඳුනාගෙන ඉදිරියේදී නිවැරදි කරන බව. | ඉතිරි තොග හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ගබඩාවේ තිබූ රු.260,000 ක් වටිනා ටයර් 04 ක් ඉතිරි තොගයේ ඇතුළත් කර නොතිබුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කළ බව. | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.1,060,562 ක උසාවි දඩ ආදායම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | ආදායම් නිවැරදිව හඳුනාගත යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර බදු ලේඛනය අනුව හිඟ හිටි ව්‍යාපාර බදු ආදායම රු.2,112,840 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව එම ආදායම රු. 2,014,240 ක් වූයෙන් රු.98,600 ක නොසැසඳීමක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන මගින් දක්වා ඇති ශේෂ සැසදිය යුතුය. |
| (ආ) | යන්ත්‍ර කුලියට දීමේ ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයට අදාළ යන්ත්‍ර කුලී ආදායම රු.4,053,985 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව එම ආදායම රු. 2,859,460 ක් වූයෙන් රු. 1,194,525 ක නොසැසඳීමක් විය. | පරික්ෂා කර බලා නිවැරදි ශේෂ ගැලපීමට කටයුතු කරන බව. | -එම- |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.55,792,954 ක් වූ ගිණුම් ශේෂ 02 ක් ශේෂ සනාථ කිරීම හා ණයගැති ණයහිමි ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ඉදිරියේදී ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කිරීමට හා සැසඳීම් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් ශේෂ තහවුරු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයහාරය රු.11,579,674 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ අයහාරය රු.7,815,748 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තුගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,384,810 | 5,117,490 | 4,009,761 | 8,072,203 | 3,364,700 | 3,235,958 | 3,368,879 | 3,852,693 |
| (ii) | කුලී | 12,382,840 | 7,231,911 | 6,446,113 | 4,087,422 | 18,932,900 | 13,421,134 | 11,012,262 | 3,162,773 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 357,250 | 203,784 | 211,784 | - | 375,200 | 163,236 | 191,236 | 8,000 |
| (iv) | වෙනත් ආදායම් | 33,505,000 | 32,771,047 | 25,414,963 | 28,588,718 | 20,882,900 | 24,781,561 | 43,947,230 | 15,122,894 |
| | | 49,629,900 | 45,324,232 | 36,082,621 | 40,748,343 | 43,555,700 | 41,601,889 | 58,519,607 | 22,146,360 |

ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **කුලී**<br>මූල්‍ය ප්‍රකාශන වල දිගින් දිගටම පැවත එන රු. 371,456 ක හිඟ මස්කඩ, මාළු කඩ, සතිපොළ, රථගාල් කුලී ආදායම් නිරවුල් කරගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | කොටසක් කපාහැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගෙන් ඉල්ලීම් කර ඇති බවද,රු.79,600 ක් අයකර ගත හැකි බව. | හිඟ ආදායම් අයකරගැනීම සඳහා අවධානය යොමුකළ යුතුය. |
| **(ආ)** | **වෙනත් ආදායම්** | | |
| (i) | ඉකුත් වර්ෂයේ සිට පැවත එන හිඟ ව්‍යාපාර බදු ආදායම රු. 1,422,940 ක් වූ නමුත්, එම හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.520,680 ක ආදායමක් පමණක් රැස්කර තිබුණි. | හිඟ ආදායම් අයකරගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ව්‍යාපාර බදු අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ii) | ඉදිරිපත් කළ වාර්තා අනුව පළාත් සභාවේ ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම රු.23,931,438 ක් සහ මුද්දර ගාස්තු ආදායම රු.4,157,280 ක් විය. | -එම- | ආදායම් ගෙන්වා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අතුරු ව්‍යවස්ථා** | | |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු, පානීය ජලය විකිණීම හා වාහන යන්ත්‍ර සූත්‍ර සඳහා කුලිය අයකිරීම යන ප්‍රධාන කාරණා 02 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පනවා නොමැති අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් පළාත් පාලන නීතිවේදියෙක් හරහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවට අයත් යුධගනාව සුසාන භූමියේ ඉඩම් වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ඉඩම්වල වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කැබ් රථයක් වසර 21 කට අධික කාලයක සිට සභා භූමියෙහි නිෂ්කාර්යව පැවතුණි. | කැබ් රථය ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත භාරදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇති බව. | අපහරණය සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා භූමියේ වසර 11 කට අධික කාලයක සිට ජල බවුසර් 02 ක් නිෂ්කාර්යව දිරාපත් වෙමින් පැවතුණි. | මහවැලි නේවාසික ව්‍යාපාර කළමනාකරණ ආයතනය "ඩී" කලාපය වෙත භාරදීමට අවශ්‍ය කටයුතු කරගෙන යමින් පවතින බව. | අපහරණය සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සහල් පිටි සැකසුම් මධ්‍යස්ථානයේ පවතින රු.142,500 ක් වටිනා යන්ත්‍රෝපකරණ 03 ක් වසර 11 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | මෙම මධ්‍යස්ථානය මිලට ගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවීම හේතුවෙන් එලෙස පවතින බව. | අපහරණය සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ප්‍රාදේශීය සභාව සඳහා රු.125,000 ක් වැය කර ඉදිකර ඇති වාහන සේවා ස්ථානයක් 2010 වර්ෂයේ සිට අදාළ අරමුණු සඳහා යොදවා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | අවශ්‍ය මානව සම්පත් නොමැති නිසා නිෂ්කාර්යව ඇති බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ විද්‍යුත් පුස්තකාල 04 ක් ආරම්භ කිරීම සඳහා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබාදී තිබුණු රු.1,330,776 ක් වූ උපකරණ හා රු.14,935,994 ක් වූ විද්‍යුත් පුස්තකාල ගොඩනැගිලි 04 ක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් නිශ්කාර්යව පැවතුණි. | අවශ්‍ය මානව සම්පත් නොමැති නිසා නිෂ්කාර්යව පවතින බව. | ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු නාම 08 ක් යටතේ පුරප්පාඩු 10 ක් ද, තනතුරු නාම 02 ක් යටතේ අතිරික්තතා 02 ක් ද විය. | එම තනතුරු සඳහා නිලධාරීන් ලබාදෙන ලෙස ලිපි මගින් ඉල්ලීම් කර ඇති බව. | අදාළ පාර්ශවවල අවධානයට යොමු කළ යුතුය. |